


# තෘෂ්ණා දෝෂ
# දීපනිය

# ක්‍ෂමණා දෝෂ දීපනිය.

කාලයාත්‍රාකළ

ස්වකීය දෙමවුපියන් වූ

දොන් හෙන්ද්‍රික් සෙනෙවිරත්න අප්පුහාමිට

— සහ —

එම හාමිනේටත්

## පින් පැමිණවීම පිණිස

දෙමටගොඩ

## චාල්ස් ඩයස් මැතිනිය

— විසින් —

නොමිලයේ බෙදාදීම සඳහා ලියනලදී.


මාලිගාකන්දපාරේ "ශ්‍රීපති යන්ත්‍රාලයේ

මුද්‍රණය කරවන ලදී.

1938.

2482.

# සංඥාපනය.

—(o)—

මාගේ තිලෝගුරු සම්මා සම්බුද්ධරජාණන්වහන්සේගේ ශාසනය කාරුණා ශාසනයයි කියනු ලැබේ. උන්වහන්සේගේ බුද්ධත්වය කාරුණාවෙන් පටන්ගෙණ ප්‍රඥාවෙන් කෙළවර වූවකි. මාගේ බුද්ධපියානන්වහන්සේ කාරුණාවෙන්ම බුදුබව පතා කාරුණාවෙන්ම පාරමිධර්මයන් සම්පූර්ණකරගත් හෙයින් මේ ශාසනය කාරුණාශාසනය නම් වෙයි. තණ්හා-දිට්ඨි-මාන ආදී ක්ලේශයන් ප්‍රඥාවෙන් ප්‍රහීණකළ හෙයින් ප්‍රඥාවෙන්ම බුද්ධරාජ්‍යයට පැමිණිසේක. එසේ හෙයින් මේ ශාසනය ප්‍රඥාවෙන් කෙළවර වූවක් වන්නේය. සසර දුක් විඳින අප වැනි සත්ත්වයන් කෙරෙහි අනුකම්පාවෙන්ම 'තණ්හාය ජායතී සෝකො' යනාදිවූ මේ ගාථාව දේශනා කළසේක. එය ධම්මපදයෙහි එයි. සංසාර සාගරයෙන් එතෙරවීමට කැමති නම් මේ තණ්හාව මොකොහොත් මොහොත දුරුකිරීමට උත්සාහ දැරිය යුතුයි. සංසාර සාගරයෙහි වැටී පීන පිනා ඉන්නාවූ අපට මේ කාරුණා ශාසනය වැනි සම්පත්තියක් මේ තුන්ලෝකයේම ඇත්තේ නැත. මෙබඳු කාරුණා ශාසනයක් ලැබගත් ඒ ශාසනයට ඇතුල්වූ උපාසක-උපාසිකා භාවයට පැමිණි හැම පින්වතෙකු විසින්ම මාගේ මේ දහම් පඬුර සාදරයෙන් පුරුදු පුහුණු කරණු ලැබේ නම් තිලෝගුරු බුද්ධරජාණන්වහන්සේ විසින් තුන්ලොවැ සත්ත්වයන්ට දයාදකොට දුන් ශාන්ති සඞ්ඛ්‍යාත නිර්වාණධාතුව අත්පත්කරගත හැකිවෙයි. අනන්ත අප්‍රමාණ සත්ත්වයෝ උන්වහන්සේ වදාළ ලෙස පිළිපැද බු

ගම්භීර පරමාර්ථ ධර්ම ස්වභාවයද තත්වූ පරිද්දෙන් දැන තෘෂ්ණා ශිත්තිවන නිවණට පැමිණියාහ. අප හැමදෙනද ඒ උතුම් නිවණට පැමිණීමට උත්සාහ දැරියයුතුය. "තෘෂ්ණා දෝෂ දීපනිය" නැමති මේ පොත ලියා උපාසක-උපාසිකාවන් අතට නොමිලයේ පත්කරන්නට අදහස් කළේ ඒ උතුම් නිර්වාණය ලබාගැනීමේ බලාපොරොත්තුවෙන්මය.

එබැවින් මේ උතුම් ධර්මදානමය පින සියල්ලෝම සතුටින් අනුමෝදන්ව නිවන් පතාගණිත්වා. මම ද මේ ලියූ පිණින් සසර දුකින් මිදී අසංඛත ධාතු සංඛ්‍යාත ඒ උතුම්වූ නිර්වාණයට පැමිණෙම්වා.

සියලු සත්ත්වයෝ සැපතට පත්වෙත්වා!

මේ වගට,

ඇඩ්ලින් ඩයස්.

2482
—— මැයි 13
1938

"සිල්වත් විලා"
මැදමටගොඩ-කොළඹ.

# විශෙෂ නිවේදනයයි.

—:(o):—

**වාල්ස් ඩයස්** මැතිනියගේ ධර්මඥතාය හා ශ්‍රද්ධාවත් නිර්මල චරිතයත් මේ කාලයෙහි බෞද්ධ ස්ත්‍රී-පුරුෂ කාවුරුන් විසිනුත් ආදර්ශයට ගතයුතු තරම්ය. මේ මැතිනිය පින්දහම් කරණ ආකාරය විශෙෂයෙන්ම ආදර්ශයට ගතයුතුය.

මේ වර්ණපොත මුද්‍රණය කරවා නොමිලයේ බෙදා දෙන්නේ ඉතා උතුම් අදහසකිනි. එනම්,- මෙහි අනුරූප විපාක ඇත්තෙයන් සසරෙන් මිදීමට එකාන්ත හෙතුව වන ප්‍රඥා සම්පත්තිය ලබාගැන්මයි.

එබැවින් මේ උතුම් අදහස ගුරුකොට ගණිමින් මේ පොත කියවා තේරුම්ගෙණ එලෙසින් ක්‍රියාකොට දෙව්-මිනිස් සැප සොළමර නිවන්සැප සාදාගන්නා ලෙස අපේ ස්ත්‍රී-පුරුෂ සැදැහැවතුන් වෙත කාරුණාවෙන් මතක්කරමි.

මිට,

විද්‍යොදය පිරිවෙණේ උපප්‍රධානාචාය්‍යී,
**කුකුල්නාපේ ශ්‍රී දෙවරක්ෂිත ස්ථවිර.**

2482/1938 මැයි 13 වෙනි දින
විද්‍යොදය පිරිවෙණේ දීය.

# තෘෂ්ණා දෝෂ දීපනිය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස.

තණ්හාය ජායති සොකො
තණ්හාය ජායති භයං,
තණ්හාය විප්පමුත්තස්ස
නත්ථි සොකො කුතො භයං.

සොකො, ( සංසාර වට්ටය මුල්කොට ඇති ) යම් කිසි ශෝකයෙක් උපදනේ වේද, හෙතෙම; තණ්හාය ජායති, සදෙර උපදනා කාම තෘෂ්ණාව නිසාම උපදනේය. භයං, ( එසේම සංසාර වට්ටය මුල්කොට ඇති ) යම් කිසි භයෙක් උපදනේ වේද, හෙතෙම; තණ්හාය ජායති, සදෙර උපදනා කාම තෘෂ්ණාව නිසාම උපදනේය, එහෙයින්; තණ්හාය විප්පමුත්තස්ස, තෘෂ්ණාවෙන් මුක්තවූ සිත් ඇත්තාහට; සොකො නත්ථි, ශෝකයෙක් නැත; භයං, භයහෙම; කුතො, කොසින් ම වේද ? කාම තෘෂ්ණාව නිසා උපදනා භයෙක් කැලම නැතැයි සේයි. යනු මෙහි පදාර්ථයි.

සංසාර වට්ටය නම් සත්ත්වයා භවයෙන් භවය උත්පත්ති මරණ වශයෙන් කරණ සැරිසැරීමයි. සසර නම් අති ශයින්ම චණ්ඩවල ස්වභාව ඇත්තකි. සතර අපාය, මනුෂ්‍ය ලෝකය, සදිව්‍ය ලෝකය, සොළොස් බඹතලය යනාදිය සසර සැරිසරණ සත්ත්වයා උපදනා තැන්ය. සතර අපාය හැමකල්හිම දුකින් පිරී පවති. මේ මිනිස් කාය තෘෂ්ණා හෙ· වෙන් දුකසේ ලත් එකකි. එහෙත් එය නා නා විධ රෝ

යන් ගෙන්ද ජරාවෙන්ද උපද්‍රව කරණලද්දේ විදුලියක් මෙන් බිඳීයයි. එබැවින් හිස ගිනි ගත්තෙකු එ ගිනි නිවන ලෙස ඉක්මන්ව නොපමාව සසර දුක් ගෙවාගත යුතුයි. ඒ පිණිස කලයුතු එකම දෙය නම් මේ තෘෂ්ණාව වැනසීමමය.

තෘෂ්ණාව නිසාම සියලුම හිත කැමති අඹු දරු ඥාති මිත්‍රාදීන්ද ස්වාමි පුරුෂයන්ද, තෘෂ්ණාවෙන් රැස්කරණ ලද ධන සම්පත්ද හැර දමා නොකැමැතිසේ මරුහට වසඟවී මෙන් කාලකිරියා නම්වූ අතිභයංකර මරණ දුකට පත්වෙයි. මෙසේ මේ මරණ දුක සිදුවීමේ හේතුව මේ තෘෂ්ණාව නම් ධන හානි, ඥාතිව්‍යසන, සොර සතුරු පීඩා ආදීයද ගින්නෙන් පැමිණෙන භය, රජුන්ගෙන් පැමිණෙන භය, නින්දා පරිභව, සිත කැමැතිදේ නොලැබීම යනාදියදැයි අනන්ත අප්‍රමාණ දුක් මේ තෘෂ්ණාව නිසාම විඳින්නට වන බව බොහෝ කොට කියයුතු නොවෙයි. තෘෂ්ණාව නිසා මේ දුක් සමූහය භය වශයෙන්ද ඇතිවෙයි. සත්ත්වයා තෘෂ්ණාවට දාසව සිටින හෙයින් මේ දුක් ගැණ නොකලකිරෙයි.

රූප තෘෂ්ණාවද, ශබ්ද තෘෂ්ණාවද, ගන්ධ තෘෂ්ණාවද, රස තෘෂ්ණාවද, ස්පර්ශ තෘෂ්ණාවද, ධර්ම තෘෂ්ණාවදැයි අරමුණෙන් වන නාම වශයෙන් විභඞ්ගයෙහි තෘෂ්ණාවට නම් සදෙනෙක් දක්වන ලදහ. ඒ තෘෂ්ණාවන් අතුරෙහි එක එක තෘෂ්ණාවක් පවතනා ආකාරයෙන් කාම තෘෂ්ණාවය, භව තෘෂ්ණාවය, විභව තෘෂ්ණාවයයි තුන් ප්‍රකාරයකින් දන්නා ලැබේ. රූප තෘෂ්ණාවම ඇසට අභිමුඛවූ රූපාරම්මණයක් කාමාස්වාද වශයෙන් ගන්නා කල්හි කාම තෘෂ්ණා නම් වන්නීය. යම් කාලෙක්හි එම අරමුණ නිත්‍යය ඒකාන්තයැයි පැවති දිට්ඨිය හා සමග පවත්නීද, එකල්හි භව තෘෂ්ණා නම් වන්නීය. ශාස්වත දෘෂ්ටිය හා සමග පැවැත්තාවූ රාගය තෙමේ භව තෘෂ්ණායයි කියනු ලැබේ. ම් කාලෙක්හි වනාහි එම අරමුණ සිඳෙන්නේය විනාශ න්නේයැයි පැවති උච්ඡේද දෘෂ්ටිය සමග පවත්නීද,

එකල්හි විභව තෘෂ්ණා නම් වන්නීය. උච්ඡේද දෘෂ්ටිය හා සමග පැවති රාගය තෙමේ විභව තෘෂ්ණාවයයි කියනු ලැබේ. ශබ්ද තෘෂ්ණාදියෙහිද මෙම ක්‍රමය වන්නේයි. අරමුණු සයේ ඇතිවන්නාවූ මේ ත්‍රිවිධ තෘෂ්ණාව ගුණිත කළ කල්හි අට ළොස් තෘෂ්ණා කොතෙක් වෙති. ඒ තෘෂ්ණාව ආධ්‍යාත්මික චක්ෂු ආදියෙහි අටළොසෙක්ද, බාහිර රූපාදී ආරම්මණයෙහි අටළොසෙක්දැයි මෙසේ අතීත කාලික තෘෂ්ණාවෝ සතිසෙක්ද, අනාගත කාලික තෘෂ්ණාවෝ සතිසෙක්ද, වර්තමාන කාලික තෘෂ්ණාවෝ සතිසෙක්දැයි කියා ප්‍රභේද වශයෙන් එකසිය අටක් තෘෂ්ණාවෝ වන්නාහුය. යම් කාලයෙක්හි චක්ෂුරාදියෙන් රූපාදී අරමුණු ගති කළ කල්හි යම් සැප වේදනාවක් උපදනීද, එකල්හි ඒ සැප වේදනාවට ලොල්වන්නාවූ තෘෂ්ණාව උපදනීය. පිපාසිත වූවාහට දූඹිලෙස පැන් ඕනෑ කරන්නාක් මෙන් තෘෂ්ණා ඇත්තාහුට ආරම්මණයන්ගේ දෘඪග්‍රහණය ඕනැවන්නේය. ඒ ආරම්මණයන්ගේ දැඩිවූ ග්‍රහණයෙන් භවය ගන්නා ලැබේ. ආහාර ලෝභයෙන් කිළිය ගිලින මත්ස්‍යයා මෙන් ආරම්මණයන්ගේ දැඩිවූ ග්‍රහණයෙන් භවග්‍රහණය කරන්නේයි. භවය ඇති කල්හි බිජුවටකින් අංකුරයක් උපදින්නාක් මෙන් භවෝත්පත්තිය වන්නීය. උපන්නාහුට සොකාදී දුක් ඇතිවන්නේය. ෂඩ්වාරික තෘෂ්ණා තොමෝ යම් පුද්ගලයකුහු කෙරෙහි පවත්නීද, ඒ පුද්ගලයාහට මහ වැස්සෙන් නැවත නැවත වස්නාලද-තෙමනලද තණකොළ වැඩෙන්නාක්මෙන් වටමූලකාවූ සොකාදීනු වැඩෙන්නාහුය. මේ තෘෂ්ණා සඞ්ඛ්‍යාත අනුශය ධර්මය කාරණ ලාභයක් ඇතිකල්හි නැවත නැවත සන්තානයෙහි උපදින්ට තිබිඳූ කාමරාග—භව රාගානුසයයන් අග්‍රමාර්ග ඥානයෙන් සිඳ නොදමනතුරු ඒ ඒ භවයන්හි සොකාදි දුක්ඛයෝ නැවත නැවත උපදනාහ. තෘෂ්ණා මාන දෘෂ්ටි ප්‍රපඤ්ච සම්ප්‍රයුක්තවූ ධර්මයෝද ආරම්මණයන් කෙරෙහි පවත්නාහ. එහෙයින් මේ කාරණය නිමිතිකොටගෙණ 'මම'ය 'මාගේ' යයි කතුවූවිය යුත්තක් නම් කැලම නැත්තේය. චක්ෂු

රයෙහි ආපාථගත ඉෂ්ටාරම්මණයක් කාමාස්වාද වශයෙන් ආස්වාදනය කරන්නාහට චක්ෂුර්වාරාදිය පිහිටකොට ගෙණ කාමරාගානුසය උපදී.

යම් සත්ත්ව කෙනෙක් තමා විසින් කරණලද දැල අනුව පවත්නාවූ එහිම වැදහෝනාවූ මකුළුවා මෙන් තමා විසින්ම කරණ ලද්දාවූ තමා විසින්ම උපදවා ගන්නා ලද්දාවූ තෘෂ්ණා ශ්‍රොතස ඉක්ම වන්නට නොහැකිවූවාහු තෘෂ්ණා නමැති මහ වතුරෙහිම ගෙද්ද, ඔහුතුමූ තෘෂ්ණා ශ්‍රොතස ඉක්මවන්නට ක්සිකාලෙකත් පොහොසත් නොවන්නාහ. වස්තුකාම-කෙලශකාමයෙහි නොඇලීමෙන්ම රහත් මගින් සියලු සසර දුක් පහකොට නිවන් පුරයට යාහැකි වන්නේය.

තෘෂ්ණාව එකාන්තයෙන් දුඃඛ හෙතුවයි. එහෙයින් ලොභ සහගත සිත් අට පමණක් දුඃඛ සත්‍යයට අයිතිවෙයි. උප්පාද—ඨිති—භඞ්ගයන් ගෙන් යුක්ත හෙයින් මේ සිත් අට දුඃඛ සත්‍යයයි. ඒ සිත් අටේ ඇතිවන ලොභ චෛතසිකය සමුදය සත්‍යයයි. ඒ සමුදයසත්‍යප්‍රතිච්ඡාදක මොහය විසින් මේ සමුදය සුඛ හෙතුවක් ලෙස සත්ත්වයාට පෙන්වා ඔහු මුළාකරයි. එය වඤ්චායවූ කල්හි සත්ත්ව තෙම තෘෂ්ණාවට වසහව තෘෂ්ණාවටම ආහාරවූ දිව්‍ය—බ්‍රහ්ම—මනුෂ්‍ය සම්පත්තීන් ලබා ගැණීම සඳහා දිව්‍යප්සරා වන්ට ආසාවෙන් පඹහයකින් පනින්නෙකු මෙන්ද, වාලුකාකාන්තාරයකට වදින්නෙකු මෙන්ද, මී බිඳකට ආශාවෙන් කඩු මුවාතක් ලෙවින්නෙකු මෙන්ද, අනාතිමේදී වන මහත්වූ දුක් පීඩා නොදැන අටවැදෑරුම් කාමාවචර කුසල් හා රූපාවචර අරූපාවචර කුසල්ද රැස්කරයි. මොවුහු භවගාමි කුසල්ය. තෘෂ්ණාව කරණකොටගෙණ සංසාර දුඃඛය නොපෙණීයයි. භවගාමිනී කුසල් රැස් කරන්නේ එහෙයිනි. සසර සැප විඳීමේ බලාපොරොත්තු වන් කරණ මේ කුසල් නිවණට උපනිඃශ්‍රයද නොවෙයි. සරටම ගෙවීයයි.

මෙසේ හෙයින් මේ තෘෂ්ණාවට වාල්වී සසර දුකේ ඇලී ගැලී බැඳී වසන සකල සත්ත්ව සමූහයා ඒ රෞද්‍ර දුකින් මුදවා නිර්වාණයට පැමිණවීමේ මාර්ගය අප බුදුපියාණන් වහන්සේම සොයාගත්සේක. ලෝකයෙහි නොයෙක් විදියේ ආගම් කර්තෘවරයන් විද්‍යමාන වුවත් දුක නැති කිරීමේ මාර්ගය පෙන්වා වදාළ එකම උත්තමයා නම් අප නාථ ගන සර්වඥයන් වහන්සේමය. සත්ත්වයාට තෘෂ්ණාව ඇති තාක් ඉපදීම නැසීම දෙක රථ චක්‍රයක් මෙන් පෙරළි පෙරළී එන්නේය. උත්පත්තිය තෘෂ්ණා ප්‍රහාණයෙන් විනා අන් කිසි ක්‍රමයකින් වළක්වාලිය නොහැක්කේය. ජාති-ජරා-මරණාදී සියලු දුක් තෘෂ්ණා හේතුවෙන් වන භවොත්පත්තියෙන් ඇතිවන්නේය. තෘෂ්ණා ප්‍රහාණක්‍රම හා එයින් ලැබියහැකි ප්‍රතිඵලයෝ බුදුපියාණන් වහන්සේගේ දේශනා මිස මුත් අන් ආගම්වල නැත්තේය. බුදුපියාණන් වහන්සේ සකල කෙලෙසයන් නසා ලෝකෝත්තර සැපතෙහි සිට අන්‍යයන්ටද ඒ උත්තම සැපය ලබා ගැණීමේ මාර්ගය පෙන්වූසේක. එසේ හෙයින් අප සියලුදෙනාම මේ ලෝකොත්තර සැපය ලබා ගැණීමට උත්සාහ දැරිය යුතුය.

තෘෂ්ණා නාමයෙන් දෙසනා පාලියෙහි ලෝභයම ආයේය. "තණ්හාති ලොභස්සෙතමධිවචනං" යනු ඒ පාලි යයි. ලෝභය චෛතසිකයකි. එය චතුර්විධ නාමස්කන්ධ අතර සංස්කාරස්කන්ධයට ඇතුළත්යි. අදූනවයක් සිත් අතුරෙන් අටක පමණක් මේ ලෝභය උපදී. ලෝභ හේතුවෙන් සත්ත්වයෝ විශේෂයෙන් කාමමිථ්‍යාචාර අභිධ්‍යා යන විවිධ දුශ්චරිතයන්හි ගැලෙති. එහි කාම මිථ්‍යාචාරය නම් අත්‍යාචාර සෙවන වශයෙන් කායද්වාරයෙහි උපදනා ව්‍යතික්‍රම චෙතනාවයි, හෙවත් නොයාසුතු තැන් ඉක්මවන චෙතනාවයි. අභිධ්‍යා නම් අනුන්ගේ සම්පත් තමා වෙත නැඹුරු කිරීමට ඇතිවන චෙතනාවයි. ගමන් බිමන් යාරණවිට චක්ෂුරින්ද්‍රියය සංවරකර නොගතහොත් ගමනක් ගොස් ගෙදර එළ විට සිදුවන අභිධ්‍යාකම්පථ සීමානොකටහැකි තරම්ය.

කාමාවචර ධර්මයන් අරමුණුකොට පවතින ලොභය කාමරාග නම්. රූපාවචර ධර්මයන් අරමුණුකොට පවතින ලොභය රූපරාග නම්. අරූපාවචර ධර්මයන් අරමුණුකොට පවතින ලොභය අරූපරාග නම්. මේ වනාහි දසසංයොජනයන්ගෙන් තුණකි. ලොභය ආශ්‍රවධර්ම වශයෙන් කාමාශ්‍රවය භවාශ්‍රවයයි දෙපරිද්දෙවේ. එකොළොස් කාම භවයෙහි පවත්නා ලොභය කාමාශ්‍රව නම්වේ. රූපා රූප භවයන්හි පවත්නා ලොභය භවාශ්‍රව නම් වේ. මේ ලොභය තෙම ධර්ම වශයෙන් ගොත්‍රභූචිත්තය දක්වා පැතිර පවත්නේය. ලොභය කාරණකොට ගෙණ සත්ත්වයෝ සැඩපහරින් මෙන් ගසාගෙණ ගොස් සසර දුකෙහි ගිලා බසින්නාහ. මෙසේ දිය සැඩපහරකට බදු හෙයින්ම ලොභය 'ඔඝ, නම් වේ. ආයතන විසින් ධර්මායතන නම්. ධාතු විසින් ධර්මධාතු නම්. සත්‍ය විසින් සමුදය සත්‍ය නම්. මේ ධර්මය චිත්තයන් සමගම උපදනේ නමුත් කුසල් සිත් විපාක සිත් ක්‍රියා සිත් සමග නූපදනේයි අකුසල් සිත් සමගම උපදී. එයිනුදු ලොභ මූලික සිත් අටදෙනා සමගම උපදී. ඒ මෙසේ දතයුතු: දශ අකුශල කර්ම පථයන්ගෙන් එකක් නම් කාම මිථ්‍යාචාරයයි. මේ අකුශලය සිදුවීමේදී බොහෝසෙයින් ලොභ සහගත සිත් අට අතුරෙන් සොමනස්ස සහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත අසංඛාරික පළමුවෙනි චිත්තයම උපදී. ඒ සිත, සතුටින්ද එහි දෙස් නොදැනීම් සංඛ්‍යාත විපරීත දෘෂ්ටියෙන්ද තමාගේ හෝ මෙරමාගේ හෝ පූර්ව ප්‍රයොග රහිතයෙන්ද යුක්ත වේ. සතුටත් විපරීත දෘෂ්ටියත් පූර්ව ප්‍රයොග සහිත බවත් යන අංගයන්ගෙන් යුක්තවී නම් ඒ දෙවන චිත්තයවේ. එසේම සතුටත් විපරීත දෘෂ්ටිය නැතිහෙයින් මානයත් අනුන්ගේ මෙහෙයීමක් හෝ තමන්ගේ පසු බැස්මක් නොමැති බවත් යන අංගයන්ගෙන් යුක්තවී නම් ඒ තෙවන චිත්තය වේ. සතුටත් මානයත් අනුන්ගේ මෙහෙයීම හෝ තමන්ගේ පසුබටවීම් බවත් වී නම් ඒ සිවුවන චිත්තයයි. එසේම මැදහත් (මධ්‍යස්ථ) බවත් විපරීත දෘෂ්ටියත්

පූර්ව ප්‍රයෝග රහිත බවත් වීනම් ඒ පස්වන චිත්තයයි. මැදගත් බවත් විපරීත දර්ශනයත් පූර්ව ප්‍රයොග සහිත බවත් වීනම් ඒ සවන චිත්තයයි. මැදගත් බවත් මානයත් පූර්ව ප්‍රයොග රහිත බවත් වීනම් ඒ සත්වන චිත්තයයි. එසේම මැදගත් බවත් මානයත් පූර්ව ප්‍රයොග සහිත බවත් වීනම් ඒ අටවැනි චිත්තයයි.

මෙසේ හෙයින් කාමමිථ්‍යාචාරය සිදුවන්නේ තෘෂ්ණාවට වහල්වීමෙනි. තෘෂ්ණා නමැති වඩුතෙමේ තමාගේ කාම් නමැති අණ්ඩි යටත් කරගත් සත්ත්ව නමැති දූසයන් ගෙණ කැමති කැමති වැඩවල යොදවමින් නිතරම දුක්දෙයි. යම් වෙළඳම්පලක හෝ කාප්පුවක උදේ සිට හැන්දෑවනතුරු කරණ වැඩ මොනවාද? තෘෂ්ණාහුගේ දූසකම්ය. උයන ගෙයක වැඩපල දිහා බැලුවොත් ඒත් තෘෂ්ණාවේම කටයුතුවෙති. කන්තෝරුවක උදේ සිට මුලු තිස්පැයම කරණ වැඩ මොනවාද? තෘෂ්ණාවේ කටයුතුයි. උසාවිවල කරණ වැඩ මොනවාද? තෘෂ්ණාවේ කටයුතුයි. එක එක ගෙදරක වෙන වෙන වෙස්වලින් පෙණී සිටින ස්ත්‍රී පුරුෂ ළමා ළපටි දූදරු මුණුබුරු ආදීහුද, ගෙවල් තුළ තිබෙන රන් රිදී මිල මුදල් ආදි සකල වස්තුහුද තෘෂ්ණාවෙන් ඇතිකළ දුක් ගොඩවල් වෙත්. කාම- රූප- අරූප යන මේ ත්‍රිවිධ භූමීන් අතුරෙන් කාම භූමිය මේ තෘෂ්ණාවෙහි මූලස්ථානය වෙයි. ආසාව කරණකොටගෙණ විපාක සතර නාම ස්කන්ධයද කර්මජ රූපස්කන්ධයද පහළවෙයි. ඒ පෙණී සිටින පඤ්චස්කන්ධය පෝෂ්‍යය කරණු පිණිස ගෙවල් දොරවල්- ඉඩකඩම් -රන්රිදී-මිල මුදල්- වෙළ හෙළඳම්- ගොවිතැන් බත්-වස්ත්‍රාභරණ- කෑම් බීම් ආදිය උවමනා කරයි. මේ තෘෂ්ණාවන් අතුරෙන් ආහාර තෘෂ්ණාව අනික් සියලු තෘෂ්ණාවන්ටම වඩා බොහෝ බලවතියි. "එකනාම කිං? සබ්බෙ සත්තා ආහාරට්ඨිතිකා" 'සියලු සත්ත්වයෝම ආහාරය නිසා ජීවත් වන්නාහ' යනු බුදුපියානන් වහන්සේ සොපාක නා රහතුන් වහන්සේට වදාළසේක. එළිඋනොත් රෑවනතු

සම්භාරන්නේ හැම නිසයි. තෘෂ්ණාවට යටත්වී මේ කරණ මැඩපලවලින් ඇතිවන දුක්ගොඩ නොතේරෙයි. තෘෂ්ණා නමැති ස්වාමියා කියන කියන ලෙස ක්‍රියා කරන් නටවී තිබේ. කාපන් කියනකොට කන්ට ඕනැය. බීපන් කියන කොට බොන්ට ඕනැය. එසේ නොකළොත් බඩගිනි-පිපාසාදි ලෙඩදුක් සාදයි. මෙලෙසින් තෘෂ්ණාදාසව්‍යය නිසා ඇතිවන මේ දුක් සියල්ලම තෘෂ්ණාවිෂ වෘක්ෂයාගේ ඵල යෝයි.

මේ දුක් ගොඩෙන් නිදහස් වීමට නම් ලොභයාගේ ප්‍රහාණ ක්‍රමය දතයුතුයි. මසුරුමල දුරුකිරීමෙන් හා දානාදී පින්කම්කොට ත්‍යාගවන්තකම මුදුන්පත්කර ගැණීමෙන් කරණ කාමාවචර කුසල බලයෙන් වන ලොභ ප්‍රහාණය තදඞ්ග ප්‍රහාණ නමී. රූපා රූපාවචරධ්‍යානමය කුසල බලයෙන් වන ලොභ ප්‍රහාණය විෂ්කම්භන ප්‍රහාණ නමී. ලොකොත්තර කුසල බලයෙන්වන ලොභ ප්‍රහාණය සමුච්ඡෙද ප්‍රහාණ නමි. සොවාන් මාර්ගය ලැබීමේදී ලොභසහගත දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් සතරම සමුච්ඡෙද ප්‍රහාණයෙන් ප්‍රහීණ වෙයි. දිට්ඨිවිප්පයුත්ත සිත්සතර රහත් මගින් සමුච්ඡෙද ප්‍රහාණයෙන් ප්‍රහීණ වෙයි. යම්හෙයකින් නිර්වාණය අරමුණුකොට තෘෂ්ණා නිරොධය වේද, එහෙයින් නිර්වාණ 'විරාග' යයිද 'නිරොධ'යයිද කියනු ලැබේ. යම්හෙයකින් නිර්වාණය අරමුණු කොට තෘෂ්ණාහුගේ කාමගුණාලයයෝ එකාන්ත නැතිව සිඳී යෙද්ද, එහෙයින් නිර්වාණය 'අනාලය'යි කියනු ලැබේ. දුක්ඛ නිරොධ සංඛ්‍යාත නිර්වාණාධිගමය සාළු කාලැ සසර අවහිර කිරීම් සඞ්ඛ්‍යාත දුක්ඛයාගේ නිරොධය වේනුයි නිර්වාණය 'තෘෂ්ණා නිරොධ' නම්ද වේ. තෘෂ්ණා මාන දෘෂ්ටි ප්‍රපඤ්ච ධර්මයන්ගේ මුල් ඉදිරීම නොකරණතාක් සංසාර විෂවෘක්ෂයාගේ සිදීමෙක් බිඳීමෙක් සමුච්ඡෙද වසයෙන් කිසිකලෙකත් නොලැබේ. මූල නොමඋදුරා අයින් කැපූ වෘක්ෂය නැවත හට ගන්නාක් මෙන්ම තෘෂ්ණාව සහමුලින් උදුරා නොදැමීමෙන් නරුත්පත්තියම සිදුවෙයි. ලොභ මූලික භවනිකාන්ති

ජවන් දුවත්. නැවත නැවත සංසාරොත්පත්තිය ඇතිකරයි. එහෙයින් රහත් වීමෙන් පසු පුනර්භවයක් ඇතිනොවේ. තෘෂ්ණා නිරොධයෙන් භව නිරොධය වෙයි. මෙසේ හෙයින් තෘෂ්ණා හෙතුවෙන් ලැබෙන සංසාර දුකින් නිදහස් වීමට සියල්ලෝම වීර්‍ය්‍ය වඩත්වා.

තෘෂ්ණා හේතුවෙන් ඇතිවන ඉහත කී ලොභ මූලික චිත්තය තොමෝ සොම්නස් සහගත සතරය, උපෙක්ෂා සහගත සතරය, දිට්ඨි සහගත සතරය, මාන සහගත සතරයයිද කියා අටවැදෑරුම් වන්නේ නමුදු ගුණිත කළ කල්හි අනෙක ප්‍රකාර වන්නේය. ඒ මෙසේයි:- දශ අකුසලයෙන් සතක් මේ සිත් අටෙන් සිදුවෙයි. එනම්:- 1. අදත්තාදානය, 2. කාමමිච්ඡාචාරය, 3. මුසාවාදය, 4. පිසුනාවචනය, 5. සම්ඵප්පලාපය, 6. අභිජ්ඣාය, 7. මිච්ඡාදිට්ඨිය යන මොහුයි. මේ අකුසල කර්ම පථ සතින් ලොභ මූලික සිත් අට ගුණිතකළ කල්හි සපණස් (56) සිත් යෙනෙක් වෙත්. ඒ සපණස් චිත්තය අතීත-අනාගත-වර්තමාන යන කාලත්‍රයෙන් ගුණිතකළ කල්හි එක්සිය අටසැට (168) අකුසල චිත්තයක් ලැබෙන්නේය. ඒ එක්සිය අටසැට චිත්තය රූප-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බ-ධම්ම යන ආරම්මණයන් ගුණිතකළ කල්හි එක්දහස් අටෙක් (1008) වෙයි. ඒ එක්දහස් අට චිත්තය අධ්‍යාත්ම සන්තානය-බහිර්ධා සන්තානය යන දෙකින් ගුණිතකළ කල්හි දෙදහස් දහසයෙක් (2016) චිත්තයෝ වෙති. ඒ දෙදහස් දහසය චිත්තය අධිපති තුනෙන් ගුණිතකළ කල්හි හදාස් හතළිස් අටෙක් (6048) චිත්තයෝ වෙති. මිථ්‍යාදෘෂ්ටියෙන් යුක්තව දිට්ඨ-සුත-මුතයන් මඞ්ගල්‍යයන් කොට ගත් කල්හි දහඅටදාස් එකසිය සතළිස් සතරක් (18144) වෙති. මෙසේ ලොභ මූලික සිත් අටෙන් ප්‍රමාණ නොකළහැකි තරම් කර්මපථ සිදුවේ. සඳ බැලීම්, යහපත් ශබ්ද ඇසීම් ආදිය මඞ්ගල්‍ය කාරණවශයෙන් සලකනවිට පහළවන්නේ මේ ලොභ සිත් අටෙන් එක් චිත්ත විථියකි. ඒ පාප චිත්තවීථිය උපදනා කල්හි ජවන් සතකින් යුක්තවූ මනොද්වාරා වර්ජන ජවන විථියක්ම උපදනේය

අනතුරුව ඇතිවන ජවන වීථි අතුරෙන් අභිසාධක නොවන්නාවූ ජවන වීථිහු කාමී වශයෙන්ද අභිසාධක වන්නාවූ ජවන වීථිහු කාමීපථ වශයෙන්ද වෙන් වෙන්කොට සැලකිය යුතුයි. අභි සාධක නොවන්නාවූ ජවනයන් විසින් පිරිවරාගන්නාලද අභි සාධක ජවන වීථියෙහි ප්‍රථම ජවන චේතනා සංඛ්‍යාතවූ කාමීය දෘෂ්ටධම්මයෙහි ප්‍රවෘත්ති විපාක මාත්‍රයක් දෙන්නේය. සත්වන ජවන සහගතවූ කාමීය අනතුරු අත්බැව්හි පටිසන්ධි විපාක වශයෙන් පිළිසඳ දෙන්නේය. නුදුනහොත් අහොසිවන්නේය. මධ්‍යයෙහිවූ ජවන පඤ්චකයෙහි චේතනාවෙන් (කාමීයෝ) පසුදෙන සංසාරයෙහි අවකාශ ලැබුනාවූ භවයෙක්හි ප්‍රතිසන්ධි-ප්‍රවෘත්ති විපාක වශයෙන් හෝ ප්‍රවෘත්ති විපාක මාත්‍රයක් හෝ දෙන්නාහයි දතයුතුයි. මෙසේ මේ කාමීයෝ රහතුන් වහන්සේගේ චුති චිත්තය දක්වාම විපාක දෙත්. පුද්ගලයාගේ අභාවයෙන් අපරාපරිය කාමීය අහෝසි වන්නේය.

සොම්නසින් යුතුව රූප—ශබ්ද—ගන්ධ—රස—පොට්ඨබ්බ සංඛ්‍යාතවූ පස්කම්සැප අනුභව කිරීමක් ඇතිකල්හි හෝ උදෑසන යහපත් රූපාලම්බණයක් දැකීම යහපත් මංගල්‍යයෙක, අයහපත්වූ රූපාලම්බණයක් දැකීම අවමංගල්‍යයෙක, ගමන් බිමන් ආදියෙහිදී යහපත් අරමුණු ඉදිරියට හමුවීම යහපතය යනාදීන් ගණනා කල්හි පහළ වන්නේ ලොභ සිත් අටෙන් එකකි. සැකෙවින් කියහොත් පුහුදුන්හට යොනිසොමනසිකාරය නැති සෑම වේලාවලම උපදින්නේ අකුසල්ය. මේ අනුව සිත යොදා බැලූ කල්හි කොතෙක්ද කුසල් සිත් පහළවන්නේ? නිතරම පාහේ පහළවන්නේ පාප චේතනාමය. මෙසින් ඇසට රූපාලම්බණය හමුවනවිට උපදින්නේ අව්‍යාකෘත සිතයි. ජවනයේදී අකුසල් සිතයි. මේ නයින් බලනවිට අව්‍යාකෘත සිතුත් පාප සිතුත් බොහෝයි. තෘෂ්ණාවෙන් යුක්තව සිටිනතුරු නිර්වාණ ගාමිනී කුසල් රැස්කිරීම ලගහටයි. ඒ වනාහි ප්‍රඥවන්ම කටයුතු දෙයකි. අපි අපේ උත්පත්තියේදීම මේ

තෘෂ්ණාව ලබාගන්නෙමු. ඒ ඒ භවයන්හි පිළිසිඳ ගන්නා සත්ත්වයන්ට චිත්ත විඥාන වශයෙන් පළමුකොටම ලොභය මුල් කොට ලොභ සහගත සිතක්ම උපදනා හෙයින්ද "තණ්හාය නීයති ලොකො-තණ්හාය පරිකස්සති" යනාදීන් වදාළ ලෙස භවයෙන් භවයට උත්පත්තිය පිණිස ගෙණ යනු ලබන් නේත්-ඔබ මොබ අදිනු ලබන්නේත් මේ තෘෂ්ණාව විසින්ම හෙයින්ද ඒ තෘෂ්ණාව නැතිකිරීම කටයුතුමය. ඊට ඇති එක් පහසු උපායයක් නම් මරණ ධර්ම සිහිකිරීමයි. "සබ්බං පහාය ගමනීයං" (සියල්ල හැරදමා යා යුතුයි.) යන දේශනාවේ හැටියට බොහෝ වෙහෙස මහන්සි දරා රැස් කරණලද ගම්බිම් – වතු කුඹුරැ—ගෙය දොර—හරකාබාන— ගහකොළ—රන් රිදී--මුතු මැණික්—තඹ පිත්තල යනාදී සියල්ලම හැරදමා යා යුතුවේ තමන්ගේ බන්ධු මිත්‍රාදී සියලු දෙනාම ලය පැලෙන තරම් ශොකයෙන් අනෙක විලාප කිය කියා හැඬුවත් ඒ සියල්ලම හැරදමා යන්ට සිදුවේ. මේ විලාප කිරීම් ආදියද "තණ්හාය ජායති සොකො" යන්නෙන් වදාළ පරිද්දෙන් තෘෂ්ණාවෙන්ම ඇතිවන ක්‍රියාවෝයි. මේ කාරුණු සිහිපෙන්-භාවනා කිරීමෙන් තණ්හාව තුනීකරගත හැකිය. මේ මහත් දුක්ගොඩ සාදන්නේ තෘෂ්ණා නැමැති උඩුවා නැති නොකළ හෙයිනි මේ දුක් ගොඩෙන් නිදහස් වීමට නම් ලොභයාගේ ප්‍රහාණ ක්‍රමය පුරුදුකළ යුතුයි. මසුරුමල තුනීකොටගෙණ දන් දීම් ආදිය කිරීමෙන් ත්‍යාගවත් බව මුදුන්පත් කරගත යුතුයි. කාමාවචර කුසල බලයෙන් වන ලොභ ප්‍රහාණය තදඞ්ග ප්‍රහාණ නමි. රූපා රූපාවචර ධ්‍යාන මය කුසල බලයෙන් වන ලොභ ප්‍රහාණය විෂ්කම්භන ප්‍රහාණ නමි. ලොකොත්තර කුසල බලයෙන් වන ලොභ ප්‍රහාණය සමුච්ඡේද ප්‍රහාණ නමී සෝවාන් මාර්ගය ලැබීමේදී ලොභ සහගත දිට්ඨිගත සම්පයුත්ත සිත් සතර සමුච්ඡේද ප්‍රහාණ යෙන් ප්‍රහීණවෙත්. දිට්ඨිගත විප්පයුත්ත සිත් සතර රහත් මගින් සමුච්ඡේද ප්‍රහාණයෙන් ප්‍රහීණ වෙත්. යම් හෙයු කින් නිර්වාණය අරමුණු කොට තෘෂ්ණා නිරොධය වේ, එහෙයින් නිවණ 'විරාග'යයිද 'නිරොධ'යයිද කියනු ලැබේ.

යම්හෙයකින් නිර්වාණය අරමුණුකොට තෘෂ්ණාහුගේ කාම ගුණාලයයෝ එකකුත් නැතිව සිඳීයෙත්ද, එහෙයින් නිර්වාණය 'අනාලය,යයි කියනු ලැබේ. දුක්ඛ නිරොධ සඞ්ඛ්‍යාත නිර්වාණාධිගමයකළ කලැ සසර අවහිර කිරීම් සඞ්ඛ්‍යාත දුඃඛයාගේ නිරොධය වේනුයි නිර්වාණය 'තෘෂ්ණානිරොධ' නම්ද වේ. තෘෂ්ණා-මාන-දෘෂ්ටි සඞ්ඛ්‍යාත ප්‍රපඤ්ච ධර්මයන්ගේ මුල් ඉදිරීම නොකරණනාක් සංසාරවිෂවෘක්ෂයාගේ සිඳීමෙක් හෝ බිඳීමෙක් සමුච්ඡෙද වසයෙන් කිසිකාලෙකත් නොලැබේ. මුල නොම උදුරා අගින් කැපූ වෘක්ෂය නැවත පටගන්නාක් මෙන්ම තෘෂ්ණානුශයේ පකාතූපනිස්සය සහමුලින් උදුරා නොදමන නාක් පුනරුත්පත්තිය සිදුවෙයි. ඒමෙසේ උගන්වා තිබේ.

අවිජ්ජා තණ්හා සංඛාර-සහජෙහි අපායිනං
විසයාදීනවච්ඡාදං නමනං ඛිපනම්පි ච.

අපායගාමී සත්ත්වයන්ට කර්ම කර්මනිමිත්තාදී ආලම්බන යෙහි ආදීනව ප්‍රතිච්ඡාදනය කිරීමය, ආලම්බනාභි මුඛකොට නම්න කිරීමය, අරමුණෙහි ප්‍රක්ෂෙප කිරීමය යන ත්‍රිවිධ කෘත්‍යයන් කරන්නාවූ සහජාතවූ අවිද්‍යා-තෘෂ්ණා-සංස්කාර යන් කාරණකොටගෙණ මුවාකිරීම අවනත කිරීම ප්‍රක්ෂෙප කිරීම වේ. යනු මෙහි භාවයි. එහි විස්තර මෙසේයි:—

පූරණ කළාවූ නානාක්ෂණික අකුශලකර්මානුභාව යෙන් එලවනලද කර්ම— කර්මනිමිත්ත— ගතිනිමිත්ත යන තුණින් යම්කිසි එකක් අරමුණුකොටගෙණ ලොභ මූලික අකුසල චිත්තයන් අතුරෙන් යම්කිසි චිත්තයක් පහළවේ. ඒ චිත්තවීථියෙහි ජවන් හා යෙදුනාවූ අවිද්‍යා වෙන් අපායෙහි දෙස් මුවාකෙරේ. එහිම යෙදුනාවූ තෘෂ්ණාවෙන් අපායට ඇල්ම කරයි. ඒ වීථියෙහි යෙදුනාවූ අකුශල කර්ම චෙතනාවන් විසින් අනතුරැ භවයම සත්ත්වයා දමාගසනලදුව මේ භවයෙහි කෙළවරවූ චුති චිත්තයාගෙන් අනන්තර-සමනන්තර-නත්‍ථි-විගත ප්‍රත්‍යය

ලැබ අනතුරුව දුර්ගති භවයෙහි මරණාසන්න ජවන සඟ
ගතවූ සහජාත කර්මප්‍රත්‍යයවූ චේතනා සඞ්ඛ්‍යාතවූ බිජුවටින්
ප්‍රතිසන්ධි විඥාන නමැති විපාක නාමස්කන්ධය සහ කර්මජ
රූප පහළවෙයි. ඒ ප්‍රතිසන්ධියට මේ භවයෙන් කිසිවක්
නොයන නුමුත් මේ භවය පිළිබඳවූ නානාක්ෂණික කර්ම
ප්‍රත්‍යයය සහජාතකර්මප්‍රත්‍යයය අවිද්‍යාය තෘෂ්ණාය යන
හෙතු චතුෂ්කයෙන් ප්‍රතිසන්ධි විඥාන නමැති අංකුරය
උපදී. මෙහි පැවති පස්කඳ හෙවත් පඤ්චස්කන්ධය මෙහිම
නිරුද්ධවෙයි. චුති චිත්තයෙන් පසු සත්විසි රූපස්කන්ධයද—
වේදනා ස්කන්ධයද සංඥා ස්කන්ධයද— සංස්කාර ස්කන්ධයද—
විඥානස්කන්ධයද සම්පූර්ණයෙන් නිරුද්ධවෙයි. දෙතිස්කුණ
පය පමණක් ඉතිරි වෙයි. එහෙත් එයද බාහිර ඍතුවෙන්
කුණුකරයි. ආගත භවය මේ පඤ්චස්කන්ධයට ඇතුළත් නා
නා ක්ෂණික කර්ම ප්‍රත්‍යයය, සහජාත කර්මප්‍රත්‍යයය, අවිද්‍යාය,
තෘෂ්ණාය යන ධර්මයන්ගේ ශක්තියෙන් ඇතිවන්නක් බැවි
න්ද, මේ භවයට ඇතුළත් බිජුවටින් අනතුරු භවයෙහි හට
ගන්නා අංකුරයක් බැවින්ද, මතු භවයෙහි පහළවන සත්
ත්වයා මේ සත්වයාද නොවෙයි, අන්‍යයෙක්ද නොවෙයි.
ඒ මෙසේ දතයුතු:— පෙර භවයෙහි ජීවත්ව සිට ගත් කර්ම-
කර්මනිමිත්ත—ගතිනිමිත්තයන් අතුරෙන් යම්කිසි අරමුණක
එල්ලී අළුත් භවයෙහි ප්‍රතිසන්ධි චිත්තය පහළවන්නේය. පෙර
භවයේ භවාඞ්ග චිත්තයාගේ ආරම්මණය චුති චිත්තයෙන්
නිරුද්ධ කරයි. ඒ වනාහි ඒ භවයෙහි ප්‍රතිසන්ධි ආරම්මණය
මය. අළුත් භවයේ ප්‍රතිසන්ධි චිත්තයට ආරම්මණය අතිසාකි.
එබැවින් ඒ සත්වයාත් නොවෙයි, අමුතු සත්වයෙකුත් නො
වෙයි. මෙසේ පිළිසිඳගත්පසු ඒ ගර්භසෙය්‍යකා (ගැබෙහි
වසන) සත්වයන්ට පඤ්ච විඥානයෝ පහළ නොවෙති.
රූපාරම්මණ—සද්දාරම්මණ ආදි ආරම්මණයන් පහළ නොවන
බැවිනි. බිහිවීමෙන් පසු නා නා ආරම්මණයන් පහළ වන
හෙයින් ඒ පඤ්ච විඥානයෝ පහළ වෙත්. මවු බුදින,
කාළ සීත-උෂ්ණ ආහාර වලින් රූපය වෙනස්වනු පමණක්
රූපය යන්නෙහි තේරුමද සීත-උෂ්ණාදියෙන් වෙන

වන ධර්මය යනුයි. අපායෙහි ඕපපාතික සත්ත්වයන්ට ප්‍රවෘත්තිවිපාක වශයෙන් ලැබිය යුතුවූ භයජනකවූ ගිනිදැල් ආදිය දැකීමෙන් අකුසලවිපාක චක්ඛුවිඤ්ඤාණ ආදියද පහළවෙයි. මෙසේ අරමුණු අනුව තෘෂ්ණා සම්ප්‍රයෝගය වන හෙයින්ම මේ සත්ත්වයන්ට සසර සාගරින් එතරවිය නොහැකිවී තිබේ. රහත් ඵලයට පැමිණීමෙන්ම තෘෂ්ණාව ක්ෂයකළ හැක්කේය. ආයති පටිසන්ධිය නැතිවන්නේ එවිටය. මේ නිදහස ලැබීමට මාර්ගය තථාගතයන් වහන්සේ ඉතා පිරිසිදු ලෙස වදාරා තිබේ. එනම් අකුසල් දුරුකිරීමය.

අකුසල් සිත් දොළොස දුරුකිරීම ඊට ප්‍රතිවිරුද්ධ දේ සිද්ධ කිරීමෙන්ම කටයුතුවා විනා අනික් ක්‍රමයකින් නොකටහැක්කේය. තමා තුළ පවත්නා අකුසල ධර්මයක් වන තෘෂ්ණාව මැඩ පැවැත්වීමට-නැතිකිරීමට තිබෙන එකම උපාය තමන්ගේ සිත තුළ තිබෙන ආසාව හෙවත් යම් යම් දේ වලට තිබෙන තෘෂ්ණාව දුරුකිරීමයි. අංගුත්තර නිකායෙහි බුදුරජාණන් වහන්සේ විසින් "ලොභො නිදානං කම්මානං සමුදයාය" යනු වදාරා තිබේ. කර්මයන්ගේ රැස්කිරීමට ලොභය එක් නිදානයකි යනු එහි තේරුමයි. මෙහි ලොභය නම් තෘෂ්ණාවයි. එය කර්ම රැස්කිරීමට හේතුවයි. මේ තෘෂ්ණායයි කියනු ලබන ලොභය අරමුණෙහි අතිශයින් ඇලීම ලක්ෂණ කොට ඇත්තේය. මේ වනාහි සැබෙවින් සසර දුක් ඇති කරදෙන පිළිවෙළයි. සත්ත්වයන්ගේ පහළවීම වනාහි පෙර ජාතිවල තෘෂ්ණා හේතුවෙන් උපදවනලද කර්ම බලයෙන් මිස අනික් දෙව බ්‍රහ්මාදීන්ගේ බලයකින් නොවන බව දතයුතුය. සහජාත චිත්ත චෛතසික ධර්මයන්ගේ බලයෙන් ප්‍රතිසන්ධිය ඇතිවීමෙන් භවොත්පත්තිය ලබයි.

චක්ෂුරාදීහු දොරටුයි. ඒ දොරටු පාලයා නම් ඒ දොරටු පිළිබඳ තෘෂ්ණාවයි. මේ චක්ෂුරාදී සදොරින් වැදගන්නා අරමුණෙහි ආසාකිරීම හෙවත් ඇලීම නිසා චක්ෂුරාදී ප්‍රසාද

හා රූපාදී අරමුණු ගැටීමෙන් වත්ථුපුරේජාත ප්‍රත්‍යය දෙමින් උපදනා චක්ඛුවිඤ්ඤාණාදී අහේතුක සිත් සමග එකුප්පාද එකනිරොධව පැමිණෙන ඵස්සාදී චෛතසික දොළසක්ද ඒ සමග ඇතිවන රූප රාශීන්ද යන මොහු අනන්තර—සමනන්තර—නත්ථි—විගත—පච්ඡාජාත ප්‍රත්‍ය යන්ගේ බලයෙන් ඉපිද නිරුද්ධ වෙති. මේ ධම්ම ජාතය සත්ත්ව පුද්ගල ජීව වශයෙන් පිළිගැණීම හේතුකොටගෙණ සත්ත්වයා මේ නාම—රූප දෙක කෙරෙහි ඇලෙයි. එහි ඇලීමයයි කියනු ලබණ තෘෂ්ණාව හේතු කොටගෙණ සසර බැඳෙයි. සසරින් මිදිය නොහී තුමූ නැවත නැවතත් සත්ත්වාදි වශයෙන්ම පිළිගණිත්. එහෙයින්ම නාම රූප පරම්පරාවන්ගේ පහළවීම සැපයක්කොට මිහිරක්කොට සලකමින් භවයෙහිම ඉපදෙමින්—ඇරෙමින් නා නා දුක් කරදරවලට ගොදුරුවෙමින් හැසිරෙත්.

භව ගමන සිඳ බිඳ දමනතුරු මේ දුක් කරදර වලින් මිදීමෙක් නම් නැත. යම් භවයක ඉපදීමේදී අවිද්‍යාවෙන් ඒ භවයේ දොස් මුවහකෙරෙයි. ඉක්බිති බිපතාක සඞ්ඛාරයන් විසින් අනාතුරු භවයට දමාගසන ලද්දුව මේ භවයෙහි අවසාන සිතවන චුතිසිතෙන් මේ භවය අවසන්වෙයි. "යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී" යන දෙශනාවේ හැටියට පුනර්භවය ඇති කරන්නාවූද නන්දිරාගය සමග පවත්නාවූද ඒ ඒ භවයෙහි ඇල්ම කරන්නාවූද යම් ඒ තෘෂ්ණාවක් වන්නී නම් ආයතිභව සඞ්ඛ්‍යාත ප්‍රතිසන්ධියට ප්‍රකෘතූප නිඃශ්‍රය වශයෙන් ප්‍රත්‍යය දෙන්නාවූ ඒ තෘෂ්ණාව 'පොනොභවිකා' නම් වන්නීය. ඕතොමෝ නානාක්ෂණික වශයෙන් ප්‍රත්‍යය දෙන්නීය. සත්ත්වයෙකුගේ උත්පත්තියේ පටන් මරණය දක්වා පවත්නාවූ තෘෂ්ණාව 'නන්දිරාග සහගත තෘෂ්ණා නම් වන්නීය.

කුසල්කිරීම නම් සිය සිතතුළ ඇති ලෝභය—ද්වේෂය—මෝහය යන ගිනි සන්සිඳුවා ගැණීමමය, හෙවත් කෙලෙශයන් නසාදැමීමය. සත්ත්වයන්ට කෙලෙස් ගින්න නිවාගත නොහැකිව අප්‍රමාණ පාපක්‍රියාවන් කරන්ට සිදුවන්නේ කුමක් හෙයින්දැයි සිතා බැලීම සියල්ලන් විසින්ම කටයුතු දෙයකි. ඒ වනාහි මේ ශාන්ත ධර්මයේ වරදක් නොව මේ උත්තම ධර්මය සෙවනය නොකිරීමේ වරද බැව් ඒත්තුගත යුතුයි. බුදු පියාණන් වහන්සේගේ අවවාදය පිළිගෙණ ප්‍රතිපත්ති ගුණ පූරන්නාහට විපතක් නැත්තේය. සියල් සසරදුක් ගෙවා සර්වකාලික ඒ ශාන්තනිර්වාණ සම්පත සිද්ධකර ගැණීමට බුද්ධාදි මහොත්තමයන්ගේ මාර්ගයවූ ආර්ය අෂ්ටාංගික මාර්ගය පිළිපැදිය යුතුයි. සෝවාන්-සකෘදගාමි-අනාගාමි-අර්හත් යන සතර මාර්ගඥානයෙන් අජරාමරවූ සර්වකාලිකවූ ඒකාන්ත සුඛස්වරූපවූ නිර්වාණ ධර්මය අවබෝධ කළේ නම් ඒ සත්ත්වයන්ගේ භවගමන වැළකී සර්වකාලික සැපතට පැමිණෙන්නේය.

මෙසේ හෙයින් නිර්වාණධර්මය සත්ත්වයන්ගේ පැවැත්මේ කෙළවරයි. එබැවින් ඒ නිර්වාණය පිළිබඳ කරුණු හැකිතාක් දැන ගැණීම අවශ්‍යය. නිර්වාණය කෙලෙස් ගිනි නිවීමෙන් පහළවන ධර්මයකි. නිර්වාණයෙහි රූපයන්ට වඩා ඇති වෙනස නම් රූප ධර්මයන් මෙන් විකාර නොවන බවත්,අතීත වර්තමානාදි භෙද වශයෙන් පැවැත්මක් නැති බවත්, චක්ඛු රූපය හා වර්ණරූපය ගැටෙන්නාක් මෙන් ගැටීමක් නැති බවත්, රූප කලාපයන්ට ඇතුළත් නොවන බවත්, මසැසට හෝ ලෞකික දිවැසට නොපෙණෙන හෙයින් අනිදස්සන බවත්,රූප ස්වභාවයන් ඉක්මවූ බැවින් අරූප නාම වන බවත් යන මෙසි. ඒ වනාහි මාර්ග ඵලයන්ට අරමුණු වන්නාවූද ප්‍රත්‍යයයන් නෙත් උපදවන ලද්දක් නොවන හෙයින් අසංඛතවූද එකම ධාතුවයි

නිර්වාණයාගේ තත්වය වදාරණ තථාගතයන් වහන්සේ: –

"විඤ්ඤාණං අනිදස්සනං—අනන්තං සබ්බතො පභං
එත්ථ ආපොච පඨවී—තෙජො වායො නගාධති
එත්ථ දීඝඤ්ච රස්සඤ්ච—අනුං ථූලං සුභා සුභං
එත්ථ නාමඤ්ච රූපඤ්ච—අසෙසං උපරුජ්ඣති
විඤ්ඤාණස්ස නිරොධෙන—එත්ථෙතං උපරුජ්ඣති"

(දීඝනිකාය කෙවට්ටසුත්ත)

යනු වදාළසේක. නිර්වාණය වනාහි ආර්ය චක්ෂුසංඛ්‍යාත මාර්ගඥානයෙන්ම දක්නායුතු බැවින් විඤ්ඤාණ නම්. මෙය අසවල් දෙය වැනියයි උපමා කිරීමට දෙයක් නැති හෙයින් අනිදස්සන නම්. උප්පාද- ඨිති- භඞ්ග වශයෙන් කෙළවරක් නැති හෙයින් හෙවත් අසවල් බුදුරජාණන් වහන්සේ දවස උපන්නේයයි කියහැකි උත්පාදන්තයක් හෝ අසවල් දවසැ නැතිවන්නේය යන ව්‍යයාන්තයක් හෝ පවත්නා කාල්හි ඇතිවන අන්‍යථාත්වයක් හෝ නැති හෙයින් අනන්ත නම්. "පභ" යනු තොටුපළට නමකි. නිවණ වනාහි සියලු දෙසින්ම තොටුපලවල් ඇත්තකි. මහා සමුද්‍රයට යම් යම් දෙසකින් බසිනු කැමැත්තවුන්ට ඒ සැම දෙසින්ම තොටුපලවල් ඇත්තාක් මෙන් නිවණටද අටතිස් වැදෑරුම් කම්ස්ථානයන්ගේ වශයෙන් සියලු දෙසින්ම බැසගැන්මට හැකිවෙයි. එහෙයින් නිවණ "සබ්බතො පභ" නම්. නිවණට තොටුපල නොවන කමටහණක් නම් නොමැති හෙයිනි. මේ නිර්වාණයෙහි පඨවී-ආපො-තෙජො-වායො යන උපාදින්නක ධර්ම සමූහය නිරුද්ධ වෙයි. ඒ වනාහි චරිම චිත්තයාගේ නිරොධයෙනි. එසේම මේ නිර්වාණයෙහි හ්‍රස්ව—දීර්ඝාදි විශෙෂයක් හෝ ලොකු- කුඩා විශෙෂයක් හෝ සුභාසුභ විශෙෂයක් හෝ නැත්තේය. නාම රූප දෙක මෙහි නිරවශෙෂයෙන් නිරුද්ධවෙත්, හෙවත් ච්‍යුති-ප්‍රතිසන්ධි වශයෙන් භව පරම්පරා ලාභය පිණිස නොපවතිත්. රහතුන් වහන්සේගේ ච්‍යුති චිත්තයාගේ නිරොධයෙ

නාම- රූප දෙක—මේ නිර්වාණයෙහි අනුත්පාද නිරොධ යට පැමිණෙයි. මේ වනාහි මේ ගාථාවන්ගේ සාමාන්‍ය අදහසයි. දැන් විශෙෂ ලියම්හ:— නිර්වාණය මාර්ග චින්තායෙන්ම දතයුත්තකි. මාර්ගඥානය ලැබූ කල්හිම නිවණට පැමිණියේ නම් වෙයි. නිර්වාණය මාර්ගයෙන් නූපන්නේ නොවේ යයි යමෙක් කියයි නම් එහි මාර්ග යෙන් පැමිණිය යුතු බව මුත් ඉපදවිය යුතු බවක් නම් නැත්තේයයි කියයුතු. ලෝකයාගේ පැවැත්ම වනාහි පඨවී ආදි ධාතුන්ගේ ආධාරයෙන් වෙයි. නිර්වාණය වූකලි ලෝකයෙන් එහාර වූවක් බැවින් එහි පඨවී ආදි ධාතුන්ගේ පිහිටීමක් නැත. ඒ බව, **"එත්ථ ආපො ච පඨවී-තෙජො වායො න ගාධති"** යනුවෙන් වදාළසේක. මෙහි දක්වන ලද ක්‍රමයෙන් නිර්වාණප්‍රාප්තියෙන් පසු හෙවත් රහතුන් වහන්සේගේ මරණයෙන් පසු අක්මුල් නැති සසරෙහි බෝකල් පැවත ආ නාම—රූප දෙකින් සවල්පයක් වත් ඉතිරි නොවන බව මනාසේ දත හැකියි. එහෙයින් නිර් වාණයේ නාම-රූප දෙකින් ලෙශ මාත්‍රයක් වත් නොමැති බව පෙනේ. ඒ බව තථාගතයන් වහන්සේ විසින් **"එත්ථ නාමඤ්ච රූපඤ්ච— අසෙසං උපරුජ්ඣති"** යනුවෙන් වදාළසේක. උන්වහන්සේ ලත් මාර්ගඥානයෙන් සාක්ෂාත් කිරීමෙන්ම නිර්වාණය ලැබියයුතු වෙයි

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබ ප්‍රීති වාක්‍යයක් වදාළසේක. එනම්:—"අනෙකජාති සංසාරං—සන්ධාවිස්සං අනිබ්බිසං" යනුයි. "පඤ්ච උපාදානස්කන්ධ නැමැති ගෙය සාද න වඩුවා සොයමින් නොයෙක් ජාති ඇති සසර ඇවිද්දෙමි දැන් මම ඒ වඩුවා සොයා ගතිමි. එම්බල ගෘහකාරකය! මින් මතු නුඹ පඤ්චස්කන්ධය නැමැති ගේ නොකරන්නෙහිය" මේ එකී ප්‍රීති වාක්‍යයේ අදහසයි. එසේ සොයන්නාවූ අපගේ බුදුපියාණන් වහන්සේට ඒ වඩුවා හමුවිය. එනම් තෘෂ්ණා වයි. ඒ තෘෂ්ණා නැමැති වඩුවා අර්හත් මාර්ගයේදී සුණු විසුණු කළසේක. කෙලෙශයන් නැමැති ගෘහොපකරණ මව්

සින් බිඳින ලද්දේයයි බුදුපියාණන් වහන්සේ වදාළ සේක. තෘෂ්ණාව වනාහි සංස්කාරයන්ගේ අනිත්‍ය—දුඃඛ—අනාත්ම යන ලක්ෂණත්‍රය නොදැනීම හේතුකොට පවතින්නාවූ නිත්‍ය-සුඛ—ආත්ම වශයෙන් ගැණීම නිසාම පවත්නේය. සංස්කාරයන්ගේ ත්‍රිලක්ෂණය ප්‍රත්‍යක්ෂකරගත් පුද්ගලයාට කිසි කාලෙක ස්කන්ධයන්හි තෘෂ්ණාවක් හටනොගණී. එහෙයින් සංස්කාරයන්ගේ ලක්ෂණප්‍රතිවේධය කරගැණීමෙන්ම තෘෂ්ණාව දුරුකළ යුතුවේ.

උත්පාදස්ථිතිභඞ්ගයන් හෙවත් ජාති- ජරා- මරණයන් නැති හෙයින් නිත්‍යයි, විකාර ස්වභාවයකට නොපැමිණෙන හෙයින් ශුභයි, සුඛයි. නවලොවුතුරු දහම් අතුරෙන් සතරමග සතර ඵලයෝ යමෙකු විසින් පිළියෙල කටයුතු හෙයින් සංඛත වෙත්. නිර්වාණය යමෙකු විසින් පිළියෙල කරණු නොලබන හෙයින් අසංඛත වෙයි. එහෙයින් නිර්වාණය උතුම්ය. නිර්වාණය සංඛත ධර්මයන් ගෙන් පහවූ හෙයින් 'විමුක්ත' කියාද සසර බැඳුම් මුදවන හෙයින් 'විමුක්ති' කියාද අඳුන්වනු ලැබේ. ප්‍රත්‍යයන් ගෙන් සැදුන ධර්මයන් කොරෙන් තොර හෙයින්ද සියලු සංස්කාරයන්ගෙන් මිදුන හෙයින්ද නිර්වාණය 'නිස්සරණ විමුක්ති' නම්ද වේ. ආර්‍ය්‍යයෝ දෘෂ්ටධර්ම සුඛ විහරණය පිණිස ඵල සමවතට සමවදිත්. එය ප්‍රත්‍යය දෙකකින් වේ. එනම්-අන් අරමුණක් මෙනෙහි නො කිරීමත් නිර්වාණය මෙනෙහි කිරීමත් යන දෙකිනි. නිර්වාණය ලොකොත්තරද හෙවත් ලොකය ඉක්මවූයේද වේ. සියලු ලෞකික ධර්මයෝ දුඃඛ සහගතවෙත්. ලොකොත්තරවූ නිර්වාණධර්මය පමණක් පරම සුඛය වේ. කාමාශාවෙන් පෙරළුනු සිත් ඇත්තාවූ මොහාන්ධවූ මනුෂ්‍යයන්ට නිවන් ලැබීම ගැණ ආසාවක් අට නොගණියි. එසේද වුවත් සසර හැසිරෙන්නාවූ මොහාන්ධවූ සත්ත්වයා අකුසල්කොට අපාය භාග් වී නම් කවර කාලෙක ඉන් මිදෙන්ට හැකිවේදැයි කල් පනා කරතොත් නිවන ඕනෑ නොවන කෙනෙකු ඇතිවිය නොහැක. ජරා මරණ වලින් පිරී තිබෙන සුගතිභවවල

ඉපිද පස්කම් සැපයෙන් පින පීනා හැමසාල්හිම සිටීමට නොහැක. එබඳු හැකක් නැති බැවින් දැන් අපට ලැබෙන්නාවූ ස්වල්ප කාලික සැපයට තෘෂ්ණාවෙන්- වහල්වී ගුණ ධර්මයන් නොපුරා සිටීම හෙවත් භාවනාවක යෙදී භාවනාවක් පුරුදු නොකිරීම ලොකු වරදකි. විදර්ශනා භාවනාවෙන් තුරන්ව නිර්වාණය ලැබිය නොහැකිය.

නිර්වාණාවබෝධයෙන් මුත් අන්විදියකින් ජාති ආදි දුඃඛයන්ගේ සන්සිඳීමක් නොමැත්තේය. ඒ දුඃඛයන්ගෙන් අත්මිදෙනු කැමති උපාසක උපාසිකාවන්ට නිර්වාණය මිස අන්‍ය රක්ෂාස්ථානයක් නොමැති බව තේරුම්ගත යුතුයි. නිර්වාණ ධර්මය ශාන්ත සැපතින් යුක්තයි. ඒ එසේ නොවේයයි හෙවත් ඒ ධර්මයෙහි ශාන්ත සැපතක් නොමැත්තේයයි තර්ක කළහැකි හේතුවක් නැත්තේය. එහි සත්‍යවූම ශාන්ත ස්වභාවයක් ඇත්තේය යනු ආර්යයන් වහන්සේලා විසින් නිරවශේෂයෙන් දක්නාලදී. නිර්වාණයාගේ වෘත්ත දුකින් මිදීම නමැති ශාන්තියක් ඇති බව පළමුවරට සොයාගත් උත්තමයා නම් අපගේ සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේයි. වෙන කිසිම ආගම් ශාස්තෘවරයෙකුට නිවන් සෙවීමේ නුවණ වත් සත්‍ය සතර දැනගැනීමේ නුවණවත් පහළ නොවීය. නිර්වාණයයි කියා භවදුකින් මිදුනාවූ අජර-අමර ශාන්ති සැපතක් ඇතිබව සොයාගත නොහැකිවිය, හෙවත් ඔවුන්ගේ ප්‍රඥාවට නිර්වාණ ධර්මය ගොචර නොවීය. එහෙයින් දුක් නැතිකරණ උපායයත් හෙවත් ඒ මාර්ගයත් ඒ මාර්ගයේ ගමන් කිරීමෙන් සොයා ගතයුතු නිර්වාණයත් සොයා ගන්නා ලද්දේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින්මය.

මෙතැන් සිට නිර්වාණයාගේ ලක්ෂණ-රස-පච්චුපට්ඨාන යන් පිළිබඳ කරුණු ස්වල්පයක් දක්වනු ලැබේ. රාගාදී කෙලෙශ යන්ගේ ක්ෂය කිරීමෙන් සියලු වෘත්ත දුඃඛය සන්සිඳුවන හෙයින් නිර්වාණය සන්සිඳීමේ ලක්ෂණයෙන් යුක්තවන්නේය. නිර්වාණයට පැමිණි උතුමෙක් එයින් චුත නොවන හෙයින් නිර්වාණයාගේ අච්‍යුතිය එහි කෘත්‍යය හෙවත්

රසය වන්නේය. නිර්වාණය වනාහි අවශෙෂ ධර්මයන් මෙන් කිසි කාලයක මෙනස් නොවන හෙයින් අවිපරිත බව එහි සම්පත්‍ය‍ නම් රසය වන්නේය පඤ්චස්කන්ධ සඞ්ඛ්‍යාත නිමිත්තන් වෙන්වීම නිර්වාණයාගේ වැටහෙන ආකාරය වන්නේය. නිර්වාණය කර්මජ නොවෙයි, ඍතුජද නොවෙයි, හෙතුජද නොවෙයි. එහෙයින් පදවස්ථානයෙක් හෙවත් ප්‍රත්‍යයයෙක් නැත්තේය.

නිවන් දැකිම නම් ඇසින් දකිමක් නොව නුවණින් අවබොධ කරගැණිමකි, හෙවත් නුවණැසින් දකිමකි. එසේ ම නිර්වාණය මාර්ගඥාන සතරෙන් ලැබිය යුත්තකි. මාර්ග-ඵල යන්ට අරමුණු වන්නකි. ඒ බව "නිබ්බාණං පන ලොකුත්තර සඞ්ඛාතෙන චතුමග්ගඤාණෙන සච්ඡිකාතබ්බං" යනුවෙන් වදාළේ. චතුර්මාර්ගවධ්‍යවූ කෙලශයන් ඒ ඒ මාර්ගයෙන් නැසූ රහතුන් වහන්සේ ඇස් කන් නාස් ආදියට අරමුණුවන රූපාදි කිසි අරමුණෙක ලොභ-ද්වෙෂ- මොහ නොම උපද වන සේක. එසේම උන්වහන්සේ නාම-රූපයන්ගේ මතු මත්තෙහි සන්තති වසයෙන් පැවැත්මට හෙතු වූ කුශල කර්මයන්ගේ ශක්තියද නැතිකළසේක. එහෙයින් උන්වහන්සේට නැවත භවයෙහි උත්පත්තියක් නැත්තේය. උන්වහන්සේ ලත් මාර්ගඥානය කර්මක්ෂයකර ඥානය වෙයි. මේ කර්මක්ෂයකර ඥානය සොවාන්, සකෘදාගාමි, අනාගාමි, අර්හත් යන සතර ආර්‍ය්‍යයන් වහන්සේලාටම ඇත්තේය. නුමුත් ඒ ආර්‍ය්‍යයන් වහන්සේලාට ඇත්තාවූ කර්මක්ෂය නම් ප්‍රතිසන්ධි කර්මක්ෂය පමණකි.

අග්‍රමාර්ගඥානයෙන් ක්ෂය වන්නේ රහතුන්ගේ මතු භව යෙහි උපදනා කර්ම පමණකි. අඞ්ගුලිමාල රහතන් වහන්සේ මෙන්-මුගලන් මහ රහතන් වහන්සේ මෙන්- දෘෂ්ටධර්ම වෙද්‍ය කර්ම-අපරාපරිය වෙද්‍යකර්මයන් ක්ෂය නොකරන්නේය. ඒ කර්මයෝ විපාක දෙන්නාහ. උන්වහන්සේලාගේ ස්කන්ධ භෙද යෙන් පසු කාම-රූප-අරූප සඞ්ඛ්‍යාත භවත්‍රයෙන් කිසි

නැතහොත් ප්‍රතිසන්ධි වශයෙන් "විඤ්ඤාණපච්චයා නාම-රූපං" යන නියමයවූ පරිද්දෙන් භවචක්‍රය පහළ නොවේ. එකල එම පුද්ගලතෙම අනුපාදිශේෂ නිර්වාණයට හෙවත් උපාධියයි කියනු ලබන ස්කන්ධ ශේෂය නැති නිර්වාණධාතුවට පැමිණියේයයි කියනු ලැබේ. නිර්වාණ ධාතුව පරමාර්ථ වශයෙන් ඇත්තාවූ ස්වභාව ධර්මයකි. මෙසේ හෙයින් නිර්වාණය මාර්ගඥාන චක්ෂුසින්ම දක්ක යුතු බවද ඒ පිළිබඳ අනුබෝධය තථාගතයන්වහන්සේ විසින් දෙශිත වූ ධර්මයන් අසා දැන ඉගෙණ ඒ අනුව ධර්මඥාන චක්ෂුසින් විමසා බැලීමෙන් සිධ කටයුතු බවද ස්වසන්තාන විෂයෙහිම ප්‍රත්‍යක්ෂ කටයුතු බවද පෙණේ. නිවණ දක්නා මාර්ගචිත්තය ලොකොත්තරවේ. එහෙයින්ම එය උපාදානස්කන්ධයන්හි ඇතුළත් නොවේ. උපාදානස්කන්ධයෝ ලොක නම් වෙති. මාර්ග චිත්තයද ලොකයම උපනිඃශ්‍රය කොට ගෙණ ඇතිවන දෙයකි. නිර්වාණයත් මේ ස්කන්ධ පඤ්චක සඞ්ඛ්‍යාත ලොකයම විෂය කොට පැණවිය යුත්තකි. එහෙයින් නිර්වාණ සඞ්ඛ්‍යාත ලොකොත්තර ධර්මයත් මේ බඹයක් පමණවූ ශරීරයම උපනිඃශ්‍රය කොට ඇති බැව් හැගේ. නිර්වාණ ධර්මය මාර්ග-ඵල චිත්තයන්ට පමණක් අරමුණු වන්නක් හෙයින් පෘථග්ජනයන්ට එහි තත්ත්වය අනුමාන සිද්ධියෙන් පමණක් දැනගත හැකියි. පළමුකොට අනුමාන සිද්ධියෙන් නිවණ සැකසේ දැන එය නිසැකකොට අවබොධ කිරීමට පූර්වභාග ප්‍රතිපත්ති පූරණය කටයුතුයි.

ආර්ය මාර්ග-ඵලඥානයන්ට ගොචරවන බැවින් නිර්වාණ ධර්මය ආර්යයන්ට ප්‍රත්‍යක්ෂයෙන් සිධයි. දාන සීල භාවනාදී පූර්වභාග ප්‍රතිපත්තිය සම්පූර්ණකිරීමෙන් ආර්යමාර්ග සඞ්ඛ්‍යාත ලොකොත්තර ප්‍රතිපදාවට පැමිණ නිවන් පසක් කළ හැකිවේ. පෘථග්ජන ගොත්‍රය ඇතිතාක් නිවණෙහි ඇති සැපය නොවැටහෙයි. ලොවුතුරා බුදුපියාණන් වහන්සේ විසින් වදාළ පරිදි නුවණින් යෙදී ඊට අනුව කරුණු සැලකීමෙන් එබඳු ධර්මයක් ඇතිවිය හැකියයිද එහි තත්ත්වය මෙබඳු යයිද අනුමාන සිද්ධියෙන් සිතාගත හැකි බැවින් ධර්මානු

ගතව අපට වැටහෙන සේ ඒ නිවණ පිළිබඳ අනුබොධය තථාගතයන් වහන්සේගේ දෙශනා ධර්මය අනුව විදර්ශනා ඥාන චක්ෂුසින් විමසා බැලීමෙන් ඇතිසාරගත හැකිවෙයි.

නිවණ ලැබීමට උපාය මාර්ග දෙකක් බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලදී. එ නම්:— සමථ භාවනාව හා විදර්ශනා භාවනාවයි. සමථ භාවනාව නම් පඨවි කසිණාදි යම්කිසි එක අරමුණක නැවත නැවත සිත පුරුදු කිරීමෙන් වෙන අරමුණක සිත යා නොදී හෙවත් වෙන යමක් ගැණ නොසිතා එහිම ස්ථිරසේ සිත පිහිටුවා ගැන්මෙන් ප්‍රථමාදී ධ්‍යාන උපදවා ගන්නා මාර්ගයයි. එකාග්‍රතායයි කියන ලද මේ ධ්‍යානයන්ගේ උත්පත්තියෙන් කාමච්ඡන්දාදි කෙලශයෝ විෂ්කම්භන වශයෙන් ප්‍රහීන වෙති. එහෙත් නැවතත් ඒ කෙලෙසුන්ගේ උත්පත්තිය විය හැකිය. එහෙයින් එපමණකින් තෘප්තියට නොපැමිණ ඒ ධ්‍යානයන් පාදක කොට ගෙණ හෙවත් ධ්‍යානයෙන් ලැබූ එකාග සිතින්ම යුක්තව විදර්ශනා භාවනාව කටයුතුයි. ඒ භාවනා මාර්ගයෙන් සංස්කාරයන් විෂයෙහි තෘෂ්ණාවුගේ පැවැත්ම හා ශුභාදී වශයෙන් බැලීමෙන් යථාතත්සේ ගැණීමත් නවතියි. ස්වභාව වශයෙන් අනිත්‍ය දුඃඛ-අනාත්මවූ සංස්කාරයන් ඒ ලක්ෂණ වශයෙන්ම මෙනෙහි කිරීමෙන් ඔවුන් පිළිබඳ ඇල්ම නැතිවී පිළිකුල්සේ වැටහෙයි. එහෙයින් රාගාදී කෙලෙස් නසා නිවන් දකිනු කැමත්තවුන් විසින් මේ පඤ්චස්කන්ධය අනිත්‍ය දුඃඛ-අනාත්ම වශයෙන් දැකීම පිණිස විදර්ශනා භාවනාව වැඩිය යුතුයි. විදර්ශනා භාවනාව පුරුදු පුහුණු කරගෙණ යාමෙන් මේ භවයේදී නොහැකිවූවද මතු භවයකදී ඒ භාවනාහුගේ ප්‍රකෘතූපනිඃශ්‍රය ප්‍රත්‍යය බලයෙන් නිර්වාණය ලබාගත හැකිවෙයි. විදර්ශනා භාවනාව කරණු කැමති යොගී පුද්ගලයා විසින් පළමුකොට පිරිසිදු සීලයෙක්හි පිහිටා විවෙක ස්ථානයෙක්හි සිට නැවත නැවත නාම-රූපයන්ගේ අනිත්‍යාදී ලක්ෂණත්‍රය මෙනෙහිකළ යුත්තේය. මීට විදර්ශනා වැඩීමයයි කියනු ලැබේ. මෙසේ නැවත නැවත ත්‍රිලක්ෂණයන් මෙනෙහි

කාරණ විම ඒ පුද්ගලයාගේ විදර්ශනා ප්‍රඥව ක්‍රම යෙන් වැඩිදියුණු වෙයි. ඒ දියුණුවූ ප්‍රඥව යම් කලෙක තීක්‍ෂ්ණ වට පැමිණියේ වේද එකල්හි සංස්කාරයන්ගේ ත්‍රිලක්‍ෂණය ප්‍රත්‍යක්‍ෂව පෙනෙන්නාවූ විදර්ශනා ප්‍රඥව පහළවේ. ඒ ප්‍රඥ ලොකයෙන් නාම—රූපයන්ගේ අසාරතාවය අස්ථිරතාවය දැකීම නිසා නිත්‍ය—සුඛ-ආත්ම වශයෙන් නාම රූපයන් වරදවා දැකීමෙන් සම්පූර්ණයෙන් දුරුවෙයි. තෘෂ්ණාව මතු නූපදනාකාරයෙන් නිරුඬවේ. තෘෂ්ණා නිරොධය සමගම තෘෂ්ණාව ඇති කල්හිම මතු උපදනාවූ භව පරම්පරාව හා සම්බන්ධවූ නාම රූපයෝද අනුත්පාද නිරොධයෙන් නිරුඬ වෙත්. නාම—රූප ධර්මයන්ගේ නූපදනා ස්වභාවයවූ ශාන්ති යම නිර්වාණය වෙයි. එහෙයින් එකොණ්හිම ගෙනොම නිර්වා ණයටද පැමිණියේ නම් වේ. ඒ රහතුන් වහන්සේගේ පිරිණිවීමේදී භවොත්පත්තියට එකම හේතුව වන තෘෂ්ණාව ක්‍ෂයකළ බැවින් ඒ උත්තමයා සොරෙහි නිර්වාණධාතුව ඉතුරුවී පස් කඳ නිරුඬවේ. ඊට "නිරුපධිශෙෂ නිර්වාණ ධාතු" යයි හෙවත් පස් කඳින් මිදුනාවූ නිර්වාණ ධාතුයයි කියනු ලැබේ.

අවිද්‍යා-තෘෂ්ණා සහිතවූ කිසි සත්වයෙකුහට කර්ම රැස් නොකොට සිටිය නොහැක. එහෙයින් අවිද්‍යා-තෘෂ්ණා සහිත පුද්ගලයා සංසාරයෙහිම සැරිසරන්නේය. නාම-රූපයන්ගේ අනිත්‍ය-දුඃඛ-අනාත්ම යන ලක්‍ෂණත්‍රය අවබොධ කරගැණීම ඔහුට ඉතා දුෂ්කර වන්නේය. භව බොහෝ ගණනක් මුළුල් ලෙහි උත්සාහයෙන් විදර්ශනා වැඩීමක් නොකළාවූ තැනැත් තන් විසින් ලෞකික කුශල කර්මයක්හුගේ ආනුභාවයෙන් බුදු කෙනෙකුන්ගෙන් බණ අසනු ලැබුවේ වී නමුත් ඔවුන්ට මාර්ග ඵල ලැබිය නොහේ. එහෙයින් ටිකා වසයෙන් නමුත් විදර්ශනා වැඩීම කළයුතුය. දානාදි ලෞකික කුසලකර්ම වනාහි සර්වඥ ශාසනය ඇති කල්හිත් නැතිකල්හිත් කළහැකිවේ. විදර්ශනා වැඩීම වූකලී සර්වඥ ශාසනයක් නොමැති කලෙක කළහැකි නොවේ. අනාත්ම ලක්‍ෂණාදී ත්‍රිලක්‍ෂණයන් සර්වඥ බුදු

කෙනෙකු ලොව පහළවී වදාරණු මිස අන් කිසිවෙක් දේශනා නොකරයි. එය සෙස්සන්ට ස්වශක්තියෙන් දතහැකි නොවන හෙයිනි. එහෙයින් යමෙක් ස්වල්ප වශයෙන්වත් සංසාරයට කාළකිරීමෙන් විදර්ශනා භාවනාව නොකෙරේ නම් හෙතෙම සර්වඥ ශාසනයෙන් ලැබියයුතු ප්‍රයෝජනය ලබාගන්නා පුද්ගලයෙක් නොවේ. මේ ලත් මාසනාවනත ජීවිතය සඵල කරගැණීමට නම් නාම-රූප දෙක ඉපගණ අසුරුසනක කාලක්වත් ත්‍රිලක්ෂණ භාවනාව මෙනෙහි කටයුතුයි.

බුධාගමේ ඇතිනාක් ප්‍රතිපත්ති ගුණධර්ම දියුණු කිරීම පිණිසමය. එබැවින් ප්‍රතිපත්ති වශයෙන් හා භාවනා වශයෙන් පිරිය යුතුවූ ඒ සියලු ධර්මයෝ කාය-වචන-සිත යන තුන්දොර පිරිසුදු කිරීම පිණිසම පවත්නාහ. එසින් ප්‍රතිපත්ති වශයෙන් පිරියයුතු වන සීලයෙන් කාය-වචන දෙක්හි පිරිසිදු බවද, භාවනා වශයෙන් වැඩියයුතු වන සමාධි-ප්‍රඥා දෙකින් සිතේ පිරිසිදු බවද ලැබේ.. එහි සීලය සමාධිය පිණිසද සමාධිය ප්‍රඥාව පිණිසද ප්‍රඥාව- නිවන් පිණිසද පවතියි. එහෙයින් පළමුකොට සීලයෙහි පිහිටා ඉක්බිති සමාධියෙන් සිත එකඟ කොටගෙණ භාවනාවක් කොට ප්‍රඥාව වඩාගත යුතුයි. මෙසේ සීල- සමාධි- ප්‍රඥා යන ත්‍රිවිධ ශික්ෂාවෙන් ලැබියයුතු නිවන් සැප කැමැත්තවුන් විසින් පළමුකොට පිරිසිදු සීලයෙක්හි පිහිටා භාවනාවක් පුරුදුකළ යුතුය. අවිශේෂයෙන් කාටත් සත්ප්‍රාය වන භාවනාව නම් ආනාපාන සතියයි. මෙය භාවනා කිරීමෙන් ලැබිය හැකි සමාධිය ලැබගෙණ ඉක්බිති ඒ ලත් සමාධිය පාදක කොටගෙණ විදර්ශනා වඩා මාර්ග ඵල ලැබිය යුතුයි. සමාධි නම් කුසල් සිත් පිළිබඳ එකඟ බවයි. එසින් සිදුවන්නේ සිතත් සිත හා උපදින චෛතසිකත් නන් අරමුණුවල විසිර යානොදී පිඩුකොට එක අරමුණක පිහිටුවීමයි. මෙය ඉතා දුෂ්කර දෙයකි. එහෙසින්ම ඉතා උතුම් දෙයකි. ආනාපාන සති භාවනාව වැනි මෙන් සමාධියක් නොලදත් ශරීරය නීරොගවනු එකාන්තයි. එබැවින් මේ උතුම් ආනාපානසති භාවනාව ගෘහස්ථ

යන් විසින් රාත්‍රි කාලයෙහි නිදාගැණීමට ප්‍රථම පැයක් හෝ දෙපැයක් පමණ කාලයක්ද උදේ පැයක් පමණ කාලයක්ද වැඩිය යුතුයි. මෙවන් පුරුදුකළ යුතුයි. සබ්බො ව අස්සසති, සබ්බො ව පස්සසති"යි වදාළ හෙයින් නියමකරගත් කාලය තුළ සිත බාහිර අරමුණුකරා ගමන් නොකරවා ආශ්වාස ප්‍රශ්වාස නමැති අරමුණෙහිම පවාගෙණ කායික චෛතසික වීර්‍ය්‍යය උපදවා භාවනා කටයුතුයි. මෙහි කායික වීර්‍ය්‍යය නම් නියමිත කාලය තුළ දිනපතා නොවරදවා භාවනා කිරීමට උපදවා ගතයුතු කාය පිළිබඳ වීර්‍ය්‍යයයි. චෛතසික වීර්‍ය්‍යය නම් ආශ්වාස ප්‍රශ්වාසාලම්බණය හැර අන් අරමුණක් කරා සිත නොයනු පිණිසත්, සිත හැකිළි කුසීත භාවයට නොයනු පිණිසත් දැඩිලෙස උපදවා ගතයුතු විරිය චෛතසිකයයි. සිහිය නාසිකාග්‍රයෙහි සවිරලෙස පිහිටුවා පිට නික්මෙන වාතය අවුත් එහි ගැටුනුකළ ආශ්වාසයයිද, ඇතුල්වන වාතය අවුත් ගැටුනුකළ ප්‍රශ්වාසයයිද තේරුම්ගෙණ සිහියෙන් යුක්තවම ඒ ආශ්වාස-ප්‍රශ්වාසවිය පැවැත්විය යුතුවේ.

මේ ආනාපානසති භාවනා ක්‍රමයෙහි විස්තර බොහෝයි. ඒ සියල්ල මෙහි ලියනු හැකි නොවේ. සැදැහැවතුන් පළමු කොට මෙපමණක් පුරුදුකළ යුතුයි. ආසාවක් උපනාහොත් විස්තර ක්‍රමය පහසුවෙන්ම ඉගෙණගන්ට ක්‍රම දැන් සැලසී තිබේ. මෙලෙසින් මේ ආනාපානසති භාවනා ක්‍රමය හෝ තමන්ට රුචි අන්කිසි භාවනා ක්‍රමයක් හෝ පුරුදුකොට මේ භයානක තෘෂ්ණාව මැඩ අජරාමර නිවන් සැප සාදාගන්ට උත්සාහවත් වන ලෙස අපේ බෞද්ධ සහෝදර සහෝදරියන් වෙත කාරුණාවෙන් මතක්කරමි.

**සියලු සත්ත්වයෝ නිවන් දකිත්වා !**

මටද මේ ලියූ පිණින් නිවණම ලැබේවා ! සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා! මමද නිදුක් වෙම්වා! සියලු සත්ත්වයෝ නිරෝග වෙත්වා! මමද නිරෝග වෙම්වා!

**නිමි.**

සංසාරයෙන් එතරවීමට [illegible] වඩනා අපගේ ගරු ශ්‍රී [illegible] හාපේ ශ්‍රී දෙවරක[illegible] හිමිපාණ[illegible] වහන්සේ විසින් පල්ලේවෙල වල්බෝලානේ-

## "වික්‍රමශිලා"

නමින් විදර්ශනා ධුරය පුරුදු කරණ පිණිස පිරිවෙණක් ආරම්භකොට පවත් වාගෙණ යනු ලැබේ.

ඒ රම්‍යවූ ස්ථානයට පැමිණිලා සිය නෙතින් දැක සතුටුවී ඒ විදර්ශනා ධුරය පුරුදු කිරීමේ පිණ අප බෞද්ධ සියලු දෙනා විසින්ම අනුමෝදන්විය යුතු බව කරුණාවෙන් මතක්කරමු.


මේබව කරුණාවෙන් මතක්කර සිටින්නේ,

(ඇඞිලින් ඩයස්.)

$\frac{2482.}{1938.}$ 5—13.

"සිල්වන්සිලා"
දෙමටගොඩ-කොළඹ.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු